**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2019**

--------------------------------------------------------------------------------

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන එජඩො මිලියන 183.90 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. රු.මිලියන 2,840 ක් වූ ඉතිරි වටිනාකම ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කොට තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ වගුව 2 හි විස්තර වන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

විගණනයෙහි කොටසක් වශයෙන් මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම<br>රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | ග්‍රාමීය හා වතු ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා වන රු. මිලියන 38.26 ක් හා ග්‍රාමීය ජල සම්පාදන පුනරුත්ථාපන යෝජනා ක්‍රම සඳහා වන රු. මිලියන 1.3 ක ප්‍රජා දායකත්වය ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඡේද අංක 38 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | 39.56 | ප්‍රජා දායකත්වය අවප්‍රමාණය වීම. | නිවැරදි ප්‍රජා දායකත්ව වටිනාකම 2020 මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ඇත. | ව්‍යාපෘතියේ නිවැරදි මුළු ප්‍රජා දායකත්වය පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව එජඩො මිලියන 90 කට සමාන රු. මිලියන 16,346.7 ක් ණය නියෝජිත ආයතනය විසින් 2019 දෙසැම්බර් 31 දිනට ලබා දී තිබූ අතර අනුරූප වටිනාකම ලෙස රු. මිලියන 14,392.03 ක් පමණක් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ණය ලැබීම් රු. මිලියන 1,954.67 කින් අවප්‍රමාණය වී තිබුණි. | 1,954.67 | ණය ශේෂය අවප්‍රමාණය වීම. | මූල්‍ය ප්‍රකාශ නිවැරදි ණය වටිනාකම දක්වයි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වැරදි ණය ශේෂය නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |
| (ඇ) | රු. මිලියන 221.80 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත්කරන ලද ග්‍රාමීය ජල සම්පාදන පුනරුත්ථාපන ව්‍යාපෘති 10 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | 221.80 | ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම්හි සංවර්ධන පිරිවැය අවප්‍රමාණය වීම. | නිමකරන ලද ව්‍යාපෘති ඉදිකිරීම් පිරිවැය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි අදාළ සංවර්ධන පිරිවැය කාණ්ඩය යටතේ හඳුනාගනු ඇත. | නිමකර ජනතා අයිතියට පත්කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති වටිනාකම් ප්‍රාග්ධනිත කිරීම අවශ්‍ය වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට නිමකරන ලද වැසිකිළිවල පිරිවැය රු. මිලියන 532.91 ක් වුවද, 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 273.53 ක් පමණ ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ හේතුවෙන් ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම්වල සංවර්ධන පිරිවැය මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 259.38 කින් අවප්‍රමාණය වී තිබුණි. | 259.38 | ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම්හි සංවර්ධන පිරිවැය අවප්‍රමාණය වීම. | නිමකරන ලද ව්‍යාපෘති ඉදිකිරීම් පිරිවැය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි අදාළ සංවර්ධන පිරිවැය කාණ්ඩය යටතේ හඳුනාගනු ඇත. | නිමකරන ලද වැසිකිළිවල වටිනාකම ප්‍රාග්ධනිත කළ යුතු වීම. |

**2.2 නිරවුල් නොකළ ශේෂ**

| විස්තරය | වටිනාකම | නිරවුල් නොකළ කාල පරිච්ඡේදය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | රු. | | | | |
| නාගරික සංවර්ධන අධිකාරියේ හා ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ ආපසු ගෙවිය හැකි තැන්පත් | 124,019,947 | වසර තුනකට වඩා වැඩි | ව්‍යාපෘති අරමුදල් ඌන උපයෝජනය | 2020 වර්ෂයේදී අය කර ගැනීමට බලාපොරොත්තු වේ. | ආපසු ගෙවිය හැකි තැන්පත් ප්‍රමාදයකින් තොරව අයකර ගත යුතු වීම. |

**2.3 රීති සහ රෙගුලාසි සමඟ අනුකූල නොවීම**

| රීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 170 (3) ඡේදය | 2018 හා 2019 කාල පරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකුගෙන් අඩුකර ගන්නා ලද රු. මිලියන 2.75 ක ඇවර කිරීමේ අලාභ 2020 ජූලි 31 දින | මුදල් රෙගුලාසිවල ප්‍රතිපාදනයන් සමඟ අනුගත වීමට අපොහොසත් වීම. | මෙම වටිනාකම 2020 වර්ෂයේදී අමාත්‍යාංශයට මාරු කරනු ඇත. | මුදල් රෙගුලාසිවල ප්‍රතිපාදනයන්ට අනුගත විය යුතු වීම. |

වන විටත් ඒකාබද්ධ අරමුදලට
බැර කර නොතිබුණි.

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය

නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය කිරිම හා පුළුල් කිරිම, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරිම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරිම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරිම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යනාදී වශයෙන් සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් නුවරඑළිය, කෑගල්ල, කිලිනොච්චි, මුලතිව්, රත්නපුරය, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරේ. පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම් | 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධනය | | ප්‍රමාද දින ගණන | බලපෑම | ප්‍රමාද වීමට හේතු | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත % | ලගාවූ % | | | | |
| **නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම** | | | | | | |
| පඹහින්න ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 62 | 109 | අපේක්ෂිත ප්‍රතිඵල කරා කාලීනව ළඟා නොවනු ඇත. | ක්‍රියාත්මක අදියරේදී කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සහ දුර්වල මුදල් ප්‍රවාහ, කොවිඩ් 19 වසංගතය, පාස්කු ප්‍රහාරය, දුර්වල ප්‍රජා දායකත්වය, අමුද්‍රව්‍ය ප්‍රවාහන දුෂ්කරතා, ජල මූලාශ්‍ර උපයෝජනයට එරෙහිව ප්‍රජාවගේ | i) දී ඇති ඉලක්කගත දිනයන් තුළ කොන්ත්‍රාත්වැඩ නිම කිරීමට කළමනාකාරීත්වය පියවර ගත යුතු වීම.<br>ii) කොන්ත්‍රාත්කරුවන්ගේ පිළිගත නොහැකි හේතුන් සඳහා කාල දිගුවන් ලබා නොදිය යුතු වීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනයක් පවතින |
| මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 85 | 264 | | | |
| මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතිය | 100 | 50 | 329 | | | |
| **පුනරුත්ථාපන හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම** | | | | | | |
| කොත්මලේ (කාණ්ඩ IV ) පුනරුත්තාපන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 90 | 55 | 87 | | | |
| කිරිඉබ්බන්වැව පුනරුත්තාපන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 91 | 181 | | | |
| ගැමුණුපුර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 65 | 31 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 47 | 321 | | විරෝධය සහ ප්‍රමාණවත් නොවන ව්‍යාපෘති කාල පරිච්ඡේදය ප්‍රමාදයන් සඳහා ප්‍රධාන හේතු වේ. | අවස්ථාවන්හිදී කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ඇවර කිරීමේ අලාභ අඩු කර ගත යුතු වීම.<br><br>iii) කාලෝචිත ආකාරයෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට හැකිවන පරිදි මහාභාණ්ඩාගාරයේ උපදේශකත්වය සමඟ කොන්ත්‍රාත්කරුවන්ට සහනයන් ලබාදීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනය ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ගල්පාය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 82 | 137 | | | |
| බංගිරිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 45 | 14 | | | |
| ශීන්ගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 67 | 153 | | | |
| බොගවාන ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පයිප්ප සැපයුම් කිරීම හා ඇතිරීම | 100 | 80 | 72 | | | |
| අඹගමුව, බොගවාන ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 29 | | | |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | පිරිවැය රු. මිලියන 25.5 කට ප්‍රදානය කරන ලද නුවරඑළිය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වන කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 09 දින වන විට නිම කිරීමට සැලසුම් කොට තිබුණි. පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය මත සියයට 70 ක වැඩ ප්‍රතිශතයක් නිම කිරීමෙන් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. ඉතිරිවැඩ නිම කිරීම 2019 අගෝස්තු 29 වන දින වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබූ අතර 2019 දෙසැම්බර් 11 වන දින නිම කිරීමේ දිනය වුවද, එම කොන්ත්‍රාත්කරුද 2020 මාර්තු 30 වන විටත් කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපොහොසත් විය. | i) කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඉහළ යාමට ඇති හැකියාව.<br><br>ii) නිදහස් කරන ලද සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකොට දීර්ඝ කාලයක් මුළුල්ලේ කොන්ත්‍රාත්කරුවන් විසින් රඳවා ගනු ඇත. | 2020 ජූලි 31 දිනට ව්‍යාපෘතිය නිම කර තිබුණි. | කාල රාමුව තුළ වැඩ නිම කිරීම සඳහා කාර්යයන් නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පිරිවැය රු. මිලියන 216.93 කට ප්‍රදානය කරන ලද කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පොන්නගර් පාතිපුරම්හි ජල සම්පාදන ව්‍යාපෘතියේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝම්බර් 20 දිනට නිම කිරීමට සැලසුම් කොට තිබුණි. පසුව සියයට 31 ක වැඩ ප්‍රමාණයක් පමණක් සම්පූර්ණ කොට තිබිය දී කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. තවද, ඉතිරිවැඩ අවසන් කිරීම සඳහා 2019 නොවැම්බර් 15 වන දින වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කොට තිබූ අතර 2020 නොවැම්බර් 28 වන දින නිම කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, 2020 මාර්තු 31 දින වන විටත් සියයට 2 ක වැඩ ප්‍රතිශතයක් පමණක් කොන්ත්‍රාත්කරු නිම කර තිබුණි. | -එම- | ඉලක්කගත කාලයට අනුව ව්‍යාපෘතිය කාර්යසාධනය වේ. | -එම- |
| (ඇ) | මොනරාගල දිස්ත්‍රික්කයේ කවුඩාව සහ දොඹගහවෙල ජල සම්පාදන ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 22 වන දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබූ අතර සියයට 75 ක වැඩ ප්‍රමාණයක් සම්පූර්ණ කොට තිබිය දී කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය මත අවසන් කොට තිබුණි. කෙසේ වෙතත්, 2020 මාර්තු 30 දින වන විටත් ඉතිරිවැඩ කොටස ප්‍රදානය කොට නොතිබුණි. | -එම- | ඉතිරි වැඩ සඳහා මාස 06 කට ටෙන්ඩර කැඳවා ඇති අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අපේක්ෂාවෙන් පවතී. | -එම- |
| (ඈ) | රු. මිලියන 105.19 ක සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගැනීමට ඉඩ හරිමින් ජල සම්පාදන ව්‍යාපෘති 10 ක නිරතවී සිටි කොන්ත්‍රාත්කරුවන්ට මුල් කොන්ත්‍රාත් කාලයද ඉක්මවා යමින් එකම ව්‍යාපෘතිය සඳහා අවස්ථා එකේ සිට හය දක්වා කාල දිගුවන් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | -එම- | ඉඩම් අත්කර ගැනීමේ ප්‍රමාදය භූගෝලීය බාධක, අයහපත් කාලගුණය හේතුවෙන් වූ ස්වභාවික ආපදා සහ සම්පත් බෙදා ගැනීමට ප්‍රජා විරෝධය සහ සහයෝගීතාවයේ හිඟකම, ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයට හේතු වී ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ජල සම්පාදන අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව බදුල්ල හල්දුම්මුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කොට තිබුණි. මේ සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීම, පාංශු පරීක්ෂාව සහ සමීක්ෂණ ක්‍රියාකාරකම් යනාදිය සඳහා 2018 සහ 2019 යන වර්ෂයන්හිදී රු. මිලියන 7.06 ක් වැය කොට තිබුණි. කෙසේ වෙතත් 2020 ජූලි 31 දක්වා කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි. | නියමිත දිනයන් තුළ ව්‍යාපෘති අරමුණ කරා ළඟා විය නොහැකි වේ. | ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අතිරේක මූල්‍යනයන් අපේක්ෂාවෙන් සිටියි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම. |
| (ඊ) | 2018 මැයි 23 දින රු.මිලියන 337.44 කට ප්‍රදානය කරන ලද බදුල්ල දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්තුව මාස 12 ක කාල පරිච්ඡේදයක් තුළදී නිම කිරීමට සැලසුම් කර තිබූ අතර, 2019 මැයි 06 වන දින රු. මිලියන 57.65 ක සංචලන අත්තිකාරමක් ගෙවීමෙන් පසුව වුවද කොන්ත්‍රාත්කරුට ලබා දී තිබූ ප්‍රතිග්‍රහණ ලිපියේ දින සිට දින 42 ක් තුළ ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි. 2019 ඔක්තෝම්බර් 29 දිනට යෝජනා ක්‍රමයේ භෞතික කාර්ය සාධනය සියයට 5 ක්ව පැවති අතර සංචලන අත්තිකාරම් කොන්ත්‍රාත්කරු අත රඳවා ගැනීමට ඉඩ හැර ඇත. තවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර කාර්යසාධන බැඳුම්කරය හා අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර ගැනීම සඳහා වූ ඉල්ලීම් ලිපිය රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් 2020 ජනවාරි 31 දින බැංකුවට යවා තිබුණි. කෙසේ වෙතත්, මාස 07 කට පසුව කාර්යසාධන බැඳුම්කරය සහ අත්තිකාරම් සුරක්ෂණය මුදල් කර ගැනීමකින් තොරව රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් වලංගු කාලය දීර්ඝ කොට තිබුණි. | i) කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඉහළ යාමට ඇති හැකියාව.<br>ii) නිදහස් කරන ලද සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකොට දීර්ඝ කාලයක් මුළුල්ලේ කොන්ත්‍රාත්කරුවන් විසින් රඳවා ගනු ඇත. | කොන්ත්‍රාත්කරු විසින් හොඳින් කටයුතු ඉටු කිරීමට එකඟ වී ඇති හෙයින් කාර්යසාධන බැඳුම්කරය හා අත්තිකාරම් සුරක්ෂණය යළි කැඳවනු ලැබීය. | i) කාල රාමුව තුළ වැඩ නිම කිරීම සඳහා කාර්යයන් නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ.<br>ii) අවසන් කළ කොන්ත්‍රාත් සඳහා කාර්යසාධන බැඳුම්කර සහ අත්තිකාරම් සුරක්ෂණය යළි කැඳවීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව හැකි ඉක්මනින් මුදල් කරගත යුතුය. |
| (උ) | ඉහත සඳහන් දිස්ත්‍රික්ක 07 තුළ ව්‍යාපෘති කාල පරිච්ඡේදය ඇතුළත වැසිකිළි 25,420 ක් ඉදිකිරීමට සැලසුම් කොට තිබූ බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට වැසිකිළි 13,098 ක් පමණක් නිම කොට තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීමට සැලසුම් කර තිබූ බදුල්ල දිස්ත්‍රික්කයේ වැසිකිළි 3,896 ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැසිකිළි 3,937 ක් අතරින් පිළිවෙලින් සියයට | i) වැසිකිළි ඉදිකිරීමේ පිරිවැය ඉහළ යාමට ඇති හැකියාව.<br>ii) නියමිත කාලය තුළ ව්‍යාපෘති අරමුණ කරා ළඟා විය නොහැකි වේ. | ග්‍රාමීය වතු ප්‍රදේශයන්හි ඉල්ලුම අවම නිසා වැසිකිළි ඉදිකිරීම ඒකක 21,000 කට අඩු කරන ලදී. | කාල රාමුව තුළ වැඩ නිම කිරීම සඳහා කාර්යයන් නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 57 ක් හා සියයට 27 ක් නියෝජනය වන පරිදි බදුල්ලේ වැසිකිළි 2,221 ක් ද, නුවරඑළියේ 1065 ක් පමණක් ද සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණය කොට තිබුණි. | | | |
| (ඉ) ව්‍යාපෘතියේ ආරම්භක සැලසුමට අනුව ආයතනික සනීපාරක්ෂක ඒකක 31 ක් ද විශේෂ අවශ්‍යතා ප්‍රතිලාභීන් සඳහා වූ සනීපාරක්ෂක ඒකක 491 ක් ද සමාලෝචිත වර්ෂය අවසානයට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ද එක් ඒකකයක් වත් නිම කර නොතිබුණි. | - එම- | විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව සඳහා වූ වැසිකිළි ඉදිකිරීමේ පිරිවැය රු.400,000 ක් දක්වා ඉහළ ගොස් ඇති හෙයින් ඒකක සංඛ්‍යාව ඒකක 50 දක්වා අඩු කරන ලදී. | -එම- |

### 3.3 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වතු මානව සංවර්ධන භාරය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වාහන එකොළහක් නිදහස් කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 14.26 ක් වැය කර තිබුණි. | ව්‍යාපෘති නොවන ක්‍රියාකාරකම් සහ අරමුණු සඳහා ව්‍යාපෘති වත්කම් උපයෝජනය. | ජල සම්පාදන මණ්ඩලයට නිදහස් කරන ලද වාහන හතක් කුලී ගිවිසුම කල් පිරීමත් සමඟ ආපසු එවා තිබුණි. මෙම ආයතනයන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා අධීක්ෂණය සඳහා සහය වන හෙයින් මෙම වාහන ඔවුන් වෙත නිදහස් කර තිබුණි. | අදාළ ආයතනයන්ගෙන් වාහන ලබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලය තනතුරු 27 කින් සමන්විත විය. එම පුරප්පාඩු 57 අතුරින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඉංජිනේරු සහ සමාජවිද්‍යාඥ යනාදී ප්‍රධාන තනතුරු ඇතුළත්ව තනතුරු 15 ක් 2019 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කිරීමකින් තොරව වසර 04 කට වඩා වැඩි කාලයක් පැවතුණි. | i) ව්‍යාපෘති කාර්ය සාධනය අහිතකර ලෙස බලපෑමට ලක්විය හැකිය. | ඉඩම් නිලධාරී, ප්‍රමාණ සමීක්ෂක සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ අවශ්‍යතාවයක් ඇති වූ හෙයින් කාර්යමණ්ඩලය ඉහළ නැංවීම සඳහා ආධාර දෙන ආයතනයේ අනුමැතිය සහිතව කාර්ය නිමවන තෙක් අදාළ නිලධාරීන් තාවකාලිකව බඳවා ගන්නා ලදී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ප්‍රතිපාදනයන්ට පටහැනිව පිටස්තර ආයතනවල සේවකයින් 135 දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබූ අතර එකතු වටිනාකම රු. මිලියන 57.93 ක වේතනයක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. තවද ඉහත සේවකයින් අතුරින් සේවකයින් 24 දෙනෙකු ප්‍රමාණ සමීක්ෂක, ගෘහ නිර්මාණ ශිල්පී, ඉඩම් නිලධාරී, වැඩබිම් අධීක්ෂක යනාදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු 08 ක් සඳහා සේවයේ යොදවා තිබුණි.

ii) වේතන සහ අනෙකුත් දීමනා ගෙවීම් සම්බන්ධයෙන් වන පාලනයන් දුර්වල විය හැකිය.